www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ට එරෙහිව පොලිස් මර්දනය මුදාහැරෙයි

**Police repression unleashed against Sri Lankan university students**

**කපිල ප්‍රනාන්දු විසිනි**
**2009 මාර්තු 02**

කැලනිය විශ්වවිද්‍යාලයේ ප්‍රතිවාදී ශිෂ්‍ය කන්ඩායම් දෙකක් අතර ඇති වූ ගැටුම්වලට ශ්‍රී ලංකාවේ ආන්ඩුව, මාධ්‍ය, පොලීසිය සහ විශ්වවිද්‍යාල බලධාරීන් දැක් වූ ප්‍රතිචාරය, රටේ ආර්ථික අර්බුදය ගැඹුරු වන තතු තුල සමාජ අසහනය මඩිනු පිනිස සූදානම් කෙරෙමින් පවතින ක්‍රමෝපායන් පිලිබඳව දිවයින පුරා තරුනයින්ට සහ කම්කරුවන්ට  අනතුරු ඇඟවීමක් ලෙස පවතී.

ආන්ඩුවේ සහයෝගය යටතේ, විශ්වවිද්‍යාල බලධාරීන්, පොලීසිය යවා ශිෂ්‍යයන් සහ ආචාර්යවරුන් ත්‍රස්ත කිරීම සහ කැලනිය සරසවිය වසා දැමීම පිනිස පසුගිය මාසය පුරා ශිෂ්‍ය කන්ඩායම් දෙක මැදිහත්වීමෙන් ඇති වූ ප්‍රචන්ඩ සිද්ධීන් ඩැහැගෙන තිබේ. දිවයින පුරා විශ්වවිද්‍යාල සහ විදුහල්වල ශිෂ්‍යයන් බිය ගැන්වීම මෙම ක්‍රියාවන් මගින් පැහැදිලිවම අදහස් කොට තිබේ.

දිවයිනේ දෙමල සුලුතරයට එරෙහි ආන්ඩුවේ යුද්ධය කම්කරු පන්තියට හා තරුනයන්ට එරෙහිව මර්දනය උත්සන්න කිරීමට මාවත සකසන බව සමාජවාදී සමානතා පක්ෂයත් (සසප) සමාජ සමානතාව සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ (සසජාශි) ව්‍යාපාරයත් දිගින්දිගටම පෙන්වා දී ඇත. මීට පෙර ජනාධිපති මහින්ද රාජපක්ෂ වැඩවර්ජක කම්කරුවන් සහ විරෝධතා දක්වන ශිෂ්‍යයන් බෙදුම්වාදී දෙමල ඊලම් විමුක්ති කොටි සංවිධානයේ (එල්ටීටීඊ) “ත්‍රස්තවාදීන්ට” සහයෝගය දෙන්නන් ලෙස හෙලා දැක තිබේ.

“විශ්වවිද්‍යාල මුදාගනු” යන මැයෙන් දක්ෂිනාංශික අයිලන්ඩ් පත්‍රයේ පසුගිය සිකුරාදා පල වූ කතුවැකියක්, කැලනිය සරසවිය වසා දැමීම සමග විශේෂයෙන්ම එල්ටීටීඊයට එරෙහි යුද්ධය සම්බන්ධ කලේය. “තව දින කිහිපයකින් උතුර ත්‍රස්තවාදයෙන් මුදාගනු ඇත” යයි එය ප්‍රකාශ කලේය. “රටේ ඒ කොටසේ යුද්ධය හමාර වූ පසුව, ඊට වෙනස් වර්ගයක ත්‍රස්තවාදයක් මගින් පීඩාවට ලක්ව ඇති උසස් අධ්‍යාපන ආයතන මුදාගනු වස් මුලු වැර යොදා ක්‍රියා කිරීමට ආන්ඩුවට සිදු වනු ඇත.”

ශිෂ්‍යයන්ට එරෙහිව ඊටත් වඩා තදබල පියවර ගන්නා ලෙස ඉල්ලා සිටිමින් කතුවැකිය මෙසේ සඳහන් කලේය: “අප නිර්භයව අන්තරායට මුහුන දිය යුතු කාලය එලඹ ඇත. උපාධි අපේක්ෂකයන්ගේ වේෂයෙන් පෙනී සිටින මැරයන් විශ්වවිද්‍යාලවල තිබෙන නිදහස වැරදි ලෙස පරිහරනය කරන අතර, පොලීසිය කැඳවීමට පැකිලෙන විශ්වවිද්‍යාල බලධාරින්ගේ පාර්ශ්වයෙන් පවතින බුරුල දන්ඩනයට ලක්වීමේ භීතියෙන් තොරව කඩාකප්පල්කාරී ක්‍රියාවන්හි යෙදීමට කරදරකාරීන්ව දිරිගන්වයි. ඔවුන්ගේ ප්‍රචන්ඩ ක්‍රියාවන්ට දිය යුතු එකම බෙහෙත නම් එවන් කරදරකාරි අවස්ථාවන්හි දී මැදිහත්වී ඔවුන් අවශ්‍ය යයි සිතන ඕනෑම විධික්‍රමයක් යොදාගෙන තත්වය පාලනය කිරීමට සහ අත්අඩංගුවට ගැනීම් සිදු කිරීමට පොලීසියට අන කිරීමයි. පවත්නා නීති එවන් දරුනු එහෙත් අත්‍යවශ්‍ය ක්‍රියාමාර්ගවලට අවසර නොදෙයි නම්, නව නීති ගෙන ඒමට ඉඩ දෙන්න.”

සසජාසී මෙම තර්ජනයට එක එල්ලේ විරුද්ධ වන අතර ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට එරෙහි ආන්ඩුවේ ප්‍රහාරයන්ට විරුද්ධ වන ලෙස සියලු සිසුන්ට කැඳවුම් කර සිටි. නමුත් පොලිස්-රාජ්‍ය විධික්‍රමවලට දොර විවෘත කර ඇත්තේ කැලනිය සරසවියේ පවත්නා ශිෂ්‍ය සංවිධානයි. විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය සංගමය තුල ආධිපත්‍යය දරන්නේ, සිය දේශපාලන ග්‍රහනය පවත්වා ගැනීම සඳහා මැර ක්‍රියාවන්හි යෙදීම සම්බන්ධව කුප්‍රකට අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බල මන්ඩලය (අවිශිබම) යි.

ශිෂ්‍යයන්ගේ පහසුකම්වල නරක තත්වයට හා සමාජ වියදම්වල තියුනු කප්පාදුවට හේතු වී තිබෙන රාජපක්ෂගේ යුද්ධයට සහයෝගය දී ඇති සහ ඔහුගේ යුද අයවැයට ඡන්දය දී ඇති සිංහල අන්තවාදී ජනතා විමුක්ති පෙරමුනට (ජවිපෙ) අවිශිබම අනුබද්ධිතය. දක්ෂිනාංශික එක්සත් ජාතික පක්ෂය (එජාප) සමග සම්බන්ධිත ජාතික ශිෂ්‍ය සහයෝගිතා පදනම (ජාශිසප) ශිෂ්‍යයන් අතර තම බලපෑම පලල් කර ගැනීම සඳහා අවිශිබම කෙරෙහි පවතින අපේක්ෂාභංගත්වය ගසා කෑමට මාන බලයි.

විශ්වවිද්‍යාල බලධාරීන් පොලීසිය කැඳවීම පිනිස පෙබරවාරි 05 වනදා කන්ඩායම් දෙක අතර ඇති වූ ගැටුමක් ඩැහැගත් අතර පොලීසිය සරසවියට කඩා වැද වගවිභාගයකින් තොරව ශිෂ්‍යයන්ට ආචාර්යවරුන්ට හා අනධ්‍යන කාර්ය මන්ඩලයට පහර දුන්හ. ආචාර්යවරුන් දෙදෙනෙක් සහ ශිෂ්‍යයන් 13ක් අත්අඩංගුවට ගන්නා ලදි. ශිෂ්‍යාවන් ඔවුන්ගේ නිර්දෝෂීභාවය පිලිබඳව ආයාචනා කර සිටියදීම පිරිමි පොලිස් නිලධාරීන් ඔවුන්ගේ කොන්ඩාවලින් ඇදගෙන ගොස් පොලිස් බස් රියට දමා ගන්නා ආකාරය රූපවාහිනි මාධ්‍ය මගින් පෙන්වීය.

ආචාර්යවරුන් දෙදෙනා එදිනම නිදහස් කෙරුනි. සතියකට පසුව ශිෂ්‍යයන් ඇප මත නිදහස් කල නමුත් විශ්වවිද්‍යාල දේපලවලට හානි කිරීම, අයුතු ජනරාශිය සහ පොලීසියට ගල් ගැසීම යන චෝදනාවලට ඔවුහු තවමත් මුහුන දී සිටිති. සිසුන්ට පහරදීම උඩ ඇති වූ මහජන කෝපය අපසරනය කරගැනීමට පොලීසිය පරීක්ෂනයක් නිවේදනය කර ඇතත් කිසිවක් සිදු වී නොමැත.

පෙබරවරී 25 වන දා අවිශිබම සහ ජාශිසප මැදිහත්වීමෙන් ඇති වූ තවත් සිද්ධියකින් පසුව නැවත වතාවක් පොලීසිය කැඳවීය. නැවත දැනුම් දෙන තුරු ශිෂ්‍යයන්ට සරසවි භූමිය තහනම් කලාපයක් ලෙස දැනුම් දී විශ්වවිද්‍යාල බලධාරීන් විසින් එය කඩිනමින් වසා දමන ලදි. එලෙසම විශ්වවිද්‍යාල පරිශ්‍රය තුල ප.ව. 5න් පසුව බාහිර ක්‍රියාකාරකම් පැවැත්වීම තහනම් කල බව උප කුලපති සරත් අමුනුගම නිවේදනය කලේය.

මෑතම ගැටුම සම්බන්ධයෙන් තවත් පිරිසක් අත්අඩංගුවට ගන්නා බව පසුගිය සිකුරාදා පොලීසිය මහේස්ත්‍රාත්වරයාට ප්‍රකාශ කලේය. සිසුන් තවදුරටත් විශ්වවිද්‍යාලය තුල රැඳී නොමැති තතු තුල පොලීසිය අනෙකුත් ප්‍රදේශයන්හි පොලිස් ස්ථාන ද යොදාගෙන සෝදිසි මෙහෙයුමක් ගෙන යමින් සිටී. කැලනිය විශ්වවිද්‍යාලයේ පොලිස් මුරපොලක් පිහිටුවා තිබේ. මේ සම්බන්ධයෙන් නිල වසයෙන් අදහස් දැක්වීමක් සිදු කොට නැති අතර, ආන්ඩුව පොලිසියට සහ විශ්වවිද්‍යාල බලධාරින්ට පූර්න සහයෝගය දී ඇති බවට සැකයක් නැත.

සසජාශි ව්‍යාපාරය, ශිෂ්‍යයන් මත එල්ල කරන ලද පොලිස් ප්‍රහාරය හෙලා දකින අතර, සියලුම චෝදනා කොන්දේසි විරහිතව ඉවත් කරගන්නා ලෙසත් කැලනිය විශ්වවිද්‍යාලයෙන් පොලීසිය ඉවත් කරකරන්නා ලෙසත් ඉල්ලා සිටී. පොලිස් ක්‍රියාමාර්ගවල මූලික එල්ලය, වසර ගනනාවක් තිස්සේ අනුබල දෙනු ලැබ තිබූ, අවිශිබමයේ සහ ජාශිසප මැරකම් නැවත්වීම නොවේ. ශ්‍රී ලංකාව තුල සහ ජාත්‍යන්තරව ධනවාදයේ වැඩෙන අර්බුදයක කොන්දේසි යටතේ විශ්වවිද්‍යාල සිසුන් අතර දේශපාලන ක්‍රියාකාරිත්වය මර්දනය කිරීම එහි එල්ලයයි. විශ්වවිද්‍යාල සිසුන්ගේ රැඩිකලීකරනය වැඩ කරන ජනතාවගේ අරගලවල පුලුල් පුපුරායාමක පූර්වකථනය විය හැකි බව කොලඹ පාලක ප්‍රභූව මැනවින් දැනුවත්ව සිටිති. 

විශ්වවිද්‍යාල තුල පැනවෙමින් තිබෙන තන්ත්‍රයේ හැටි ස්වභාවය පිලිබඳ තවත් අනතුරු ඇඟවීමක් නම්, ''ගෝලීය ආර්ථික අර්බුදය සහ විසිඑක් වන සියවසේ සමාජවාදය සඳහා පූර්වාපේක්ෂාවන්'' යන මැයෙන් මාර්තු 4 දා පැවැත්වීමට නියමිතව තිබූ සම්මන්ත්‍රනයට අනුග්‍රහ දැක්වීමට ප්‍රවාද කවය ශිෂ්‍ය කන්ඩායමට අවසර ලබා නොදීමට පෙබරවාරි 27 වෙනි දින කොලඹ විශ්වවිද්‍යාලය ගත් තීන්දුවයි. විශ්වවිද්‍යාල බලධාරිහු සියලුම දේශපාලන සම්මන්ත්‍රන මත වාරනයක් පැනවීම සඳහා කඩතුරාවක් ලෙස කැලනිය විශ්වවිද්‍යාලයේ ගැටුම් හුවා දැක්වීය. සසප ප්‍රධාන ලේකම් විජේ ඩයස් ඉහත සම්මන්ත්‍රනයේ දේශකයකු ලෙස සහභාගි වීමට නියමිතව සිටියේය.

දේශපාලන ආනුභාවය සඳහා ඔවුනොවුන් අතර රුදුරු සතුරුකම් පැවතියේ වුවත්, අවිශිබම සහ ජාශිසප අත ශිෂ්‍යයන් ආරක්ෂා කිරීම සඳහා මොනයම්ම හෝ ඉදිරිදර්ශනයක් ඇත්තේ නැත. දෙපාර්ශ්වයම ආන්ඩුවේ වර්ගවාදී යුද්ධයට සහාය දෙන අතර විශ්වවිද්‍යාලවල ද නිදහස් අධ්‍යාපනයේ ද පරිහානියට යුද්ධය සමග මොනම සම්බන්ධතාවක් නැති බව අවධාරනය කරති. ශිෂ්‍යයන්ගේ දුක්ගැනවිලි අරබයා ඔවුන් ගෙනයන සීමිත විරෝධතා සියල්ල යොමුකෙරී ඇත්තේ සහන දෙන ලෙස ආන්ඩුවට බලපෑම් දැමීමටය.

දිවයින පුරා විශ්වවිද්‍යාලවල සිටින සිය සහෝදර ශිෂ්‍යයන් මෙන්ම, කැලනිය විශ්වවිද්‍යාල ශිෂ්‍යයෝ ද දේශන ශාලාවල හා නේවාසිකාගාරවල පවතින තදබදය, විද්‍යාගාර සහ පරිඝනක පරීක්ෂනාගාර වැනි සහායක පහසුකම්වල මදකම සහ ප්‍රමානවත් ලෙස ආචාර්යවරුන් නොමැති වීම යන ප්‍රශ්නවලට මුහුන දී සිටිති. නමුත් ජනාධිපති මහින්ද රාජපක්ෂ සියල්ල යුද්ධය වෙනුවෙන් කැපකල යුතු යයි අවධාරනය කරන හෙයින් අධ්‍යාපනයට ප්‍රමානවත් මුදල් නැත. නිදහස් අධ්‍යාපනයට සහ සෞඛ්‍යයට පිලිවෙලින් රුපියල් බිලියන 41ක් සහ බිලියන 47ක් පමනක් වෙන් කරන අතරේ මෙම වසරේ යුද්ධයට වෙන් කල මුදල රුපියල් බිලියන 200ට නංවා ගෙන තිබේ.

එල්ටීටීඊයේ මිලිටරි ධාරිතාව විනාශ කර දැමීමෙන් හමුදාව ජයග්‍රාහී වුව ද කැපකිරීම් සඳහා ආන්ඩුවේ ඉල්ලීම් නතර නොවනු ඇති අතර, ගෝලීය ආර්ථික පසුබැස්මේ සමස්ත බලපෑම දිවයින මත කඩාපාත් වන විට එම ඉල්ලීම් උත්සන්න වනු ඇත. ශිෂ්‍යයන්ගේ නොසන්සුන්කම පිපිරී ඒමේ බියෙන් ආන්ඩුව එය පූර්ව-භංග කිරීමේ ක්‍රියාමාර්ග ගනිමින් සිටී. එවැනි විධික්‍රම විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ට සීමා නොවනු ඇති අතර, තමන්ගේ රැකියා සහ ජීවන තත්වයන් ආරක්ෂාකර

ගැනීමේ වැයමක නිරත ගම්බද දුගීන් සහ කම්කරුවන්ට එරෙහිව යොදාගැනෙනු ඇත.

එල්ටීටීඊයට එරෙහි හමුදා ජයග්‍රහනවල ඉස්මත්තේ දී පාලක කව තුල දැන් වැඩෙන ප්‍රතිගාමී ජයොන්මාදයේ ඇඟවීම් දි අයිලන්ඩ් කතුවැකිය සමාප්ත කිරීමේ දී ප්‍රකාශය පත් කර තිබුනි. ''නිර්දය ත්‍රස්තවාදී කන්ඩාමකින් වර්ග කිලෝමීටර් 15,000ක් මුදා ගත් රටක, දේශපාලනිකව බංකොලොත් ආන්තික රැඩිකල්වාදී කල්ලියක ග්‍රහනයෙන් විශ්වවිද්‍යාල කීපයක් මුදවා ගැනීම කුඩා ලමුන්ගේ සෙල්ලමක් විය යුතුය'' යයි එය ප්‍රකාශ කලේය.

වැඩ වර්ජක කම්කරුවන්ට හෝ විරෝධතා දක්වන ගොවියන්ට, තථ්‍ය වශයෙන් ම ආන්ඩුවට හෝ එය ආරක්ෂා කරන ධනපති ක්‍රමයට තර්ජනය කරන ඕනෑම අයෙකුට, එරෙහි කඩාපැනීම් යුක්ති සහගත කිරීමට මෙම භාෂාවම පහසුවෙන්ම යොදා ගත හැකිය. දෙමල සුලුතරයට එරෙහි 25 වසරක යුද්ධය පුරා ගොඩනගනු ලැබ ඇති රාජ්‍ය මර්දන යන්ත්‍රය, දේශපාලනික විපරිමතවල හා විරුද්ධත්වයේ සියලු ආකාරයන්ට එරෙහිව හරවනු ඇති බවට සසජාශි ව්‍යාපාරය අනතුරු අඟවා සිටියි.

ශිෂ්‍යයන්ට තමන්ගේ ප්‍රජාතාන්ත්‍රික අයිතීන් හා ජීවන මට්ටම් ආරක්ෂා කරගත හැකිවන්නේ, යුද්ධයට සහ එය නිර්මානය කල ලාභ ගරන පද්ධතියට එරෙහිව කරන දේශපාලනික අරගලයක් මගින්ම පමනි. සහනයන් සඳහා රාජපක්ෂ අන්ඩුවට බලපෑම් දැමීමේ නිශ්ඵල උත්සාහයන්හි නිරත වෙමින් සිටිනවා  වෙනුවට, සමාජවාදී පදනමක් මත සමාජය ප්‍රතිනිර්මානය කිරීමේ සමත් එකම සමාජ බලවේගය වන, ශ්‍රී ලංකාවේ, සමස්ත කලාපයේ සහ ජාත්‍යන්තර පරිමාන, කම්කරු පන්තිය වෙත ශිෂ්‍යයෝ හැරිය යුතුය. දශක ගනනාවක් තිස්සේ කම්කරු පන්තිය භේද කිරීමට යොදා ගනු ලැබූ, එල්ටීටීඊයේ දෙමල බෙදුම්වාදය ඇතුලු, ජාතිකවාදයේ හා වර්ගවාදයේ සියලු රූපාකාරයන් ප්‍රතික්ෂේප කිරීමක් මෙය පෙරලා ඉල්ලා සිටී.

මෙම දේශපාලනික ඉදිරිදර්ශනයට සටන් වැදීමට ජාසජාශි ව්‍යාපාරයට බැඳෙන ලෙස තරුනයන්ගෙන් සහ ශිෂ්‍යයන්ගෙන් අපි ඉල්ලා සිටිමු.

© www.wsws.org